කාඩ්පත්හිමියන්ගේ ගිවිසුම

වැදගත් :- අමුණා ඇති නේෂන් ට්‍රස්ට් බැංකු කාඩ්පත අත්සන් තැබීමට සහ භාවිතා කිරීමට පෙර කරුණාකර කාඩ්පත්හිමියන්ගේ ගිවිසුම සැළකිලිමත්ව කියවන්න. කාඩ්පත භාර ගැනීම සහ/හෝ අත්සන් කිරීම සහ/හෝ භාවිතා කිරීම මගින් ඔබ පහත දැක්වෙන නියමයන් සහ කොන්දේසීන් පිළිගන්නා අතර, ඒවායෙන් බැඳීමට ලක් වේ.

01. අර්ථ දැක්වීම

(a) අයදුම්කරු - කාඩ් අයදුම්පත් පෝරමයට අත්සන් තබන ලද ඕනෑම පුද්ගලයකු අදහස් කෙරේ.

(b) බැංකුව - නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් කෙරේ.

(c) ප්‍රාථමික කාඩ්පත්හිමියන් - යම් කාඩ්පත්හිමියෙකුගේ නමින් බැංකුව විසින් කාඩ්පත් ගිණුමක් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට තීරණය කරන ලද්දේ නම් එවැනි කාඩ්පත්හිමියකු අදහස් කෙරේ.

(d) කාඩ්පත් - බැංකුව විසින් නිකුත් කරන නේෂන් ට්‍රස්ට් ප්ලැටිනම් සහ වර්ල්ඩ් මාස්ටර් කාඩ් ක්‍රෙඩිට් කාඩ්පතක් අපේක්ෂා කෙරේ.

(e) කාඩ්පත් ගිණුම - මෙම ගිවිසුම යටතේ ප්‍රාථමික කාඩ්පත්හිමියකු ලෙස අතිරේක කාඩ්පත් හිමියකු/යන් වෙතොත් ඔවුන් විසින් ලබාගන්නා හෝ වැයකරන්නා වූ සියළුම හර බැර ඇතුළත් කිරීමේ අරමුණින් බැංකුව විසින් විවෘත කරන කාඩ්පත් ගිණුම අදහස් කෙරේ.

(f) මූල්‍ය ණය - කාඩ්පත, කාඩ්පත් අංකය හෝ රහස්‍ය අංකය භාවිතා කරමින් මුදල් ලබා ගැනීමේ ක්‍රියාව අදහස් කෙරේ.

(g) මූල්‍ය ණය සීමාව - මූල්‍ය ණය සඳහා බැංකුව විසින් අනුමත කරන උපරිම සීමාව අදහස් කෙරේ.

(h) කාඩ්පත්හිමියා - බැංකුව විසින් කාඩ්පතක් නිකුත් කරනු ලබන අයදුම්කරුවකු අදහස් කෙරේ.

(i) අය කිරීම හෝ ගණු දෙනුව - මෙම ගිවිසුම යටතේ අය කර ගන්නා ලද අදාල ගාස්තු ද ඇතුළත්ව කාඩ්පත් මගින් කරනු ලබන අය කිරීමක් සහ කාඩ්පත්හිමියා එකඟ වන පරිදි බැංකුවට ගෙවීමට එකඟව ඇති හෝ වගකීමට බැඳීමට එකඟ වන පරිදි බැංකුවට ගෙවීමට එකඟව ඇති හෝ එකඟවන කාඩ්පත්හිමියා වගකීමකට බැඳීමට එකඟවන ලද මුළු මුදල් ප්‍රමාණය වේ.

(j) මූල්‍ය සීමාව - කාඩ්පත් ගිණුම යටතේ බැංකුව විසින් අනුමත කරන උපරිම හර ශේෂය අදහස් කෙරේ.

(k) ජංගම ශේෂය - කාඩ්පත් ගිණුමෙහි යම් දිනකට වන සම්පූර්ණ මුදල් හිඟ හිටුවා ඇති ප්‍රමාණය අදහස් කෙරේ.

(l) ගෙවිය යුතු අවම මුදල - ගෙවිය යුතු දිනට ගෙවිය යුතු අවම මුදල වශයෙන් ගිණුම් ප්‍රකාශයේ සඳහන් වන මුදල වේ.

(m) එතෙර ගණුදෙනු - විදේශයක දී සිදු කරන ලද ගණුදෙනු අදහස් කෙරේ.

(n) අතීතයේ ගෙවිය යුතුව තිබූ මුදල් - පූර්ව ගිණුම් ප්‍රකාශන වල ගෙවිය යුතු අවම මුදලේ හිඟ හිටවා ඇති සමුච්චිත මුදලක් වෙතොත් එය වේ. අතීතයේ ගෙවිය යුතුව තිබූ මුදල් ගිණුම් ප්‍රකාශයේ වෙනම දක්වා ඇති අතර ඒවා වහාම ගෙවිය යුතු වේ.

(0) ගෙවීම් කළ යුතු දිනය - සම්පූර්ණ හිඟ හිටවා ඇති මුදල හෝ ඉන් කොටසක් හෝ ගෙවිය යුතු අවම මුදල අවම මුදල යම් දිනකට බැංකුවට ගෙවිය යුතු යැයි ගිණුම් ප්‍රකාශයේ අදහස්කර ඇත්ද එම දිනය අදහස් කෙරේ.

(p) රහස්‍ය අංක (PIN) - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) මගින් කාඩ්පත භාවිතා කිරීම සඳහා කාඩ්පත්හිමියන්ට බැංකුව විසින් ලබාදෙනු ලබන හෝ කාඩ්පත්හිමියා විසින්ම තෝරා ගන්නා පෞද්ගලික අනන්‍යතා අංකය අදහස් කෙරේ.

(q) පසු දිනය - කාඩ්පත්හිමියාගේ අංකයට ගණුදෙනුවක් සකස් කර පැවරෙන දිනය අදහස් කෙරේ.

(r) සේවා ආයතන - භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී කාඩ්පත් පිළිගනු ලබන හෝ ගෙවුම් උපකරණයක් වශයෙන් කාඩ්පත පිළිගැනීමට කැමති කුමන ස්ථානයක හෝ පිහිටා ඇති සේවා ස්ථානයක් අදහස් කෙරේ.

(s) ප්‍රකාශනය - කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් ප්‍රාථමික කාඩ්පත්හිමියකු/යන්ගේ අදාල දිනට වන මූල්‍යම වගකීම දක්වමින් බැංකුව විසින් කාඩ්පත්හිමියකුට යවනු ලබන මාසික ගිණුම් ප්‍රකාශය අදහස් කෙරේ.

(t) අතිරේක කාඩ්පත්හිමියා - ප්‍රාථමික කාඩ්පත්හිමියාගේ ඉල්ලීම මත කාඩ්පතක් නිකුත් කරනු ලැබූ, ප්‍රාථමික කාඩ්පත්හිමියන්ගේ ගිණුමෙන් අදාළ තැනැත්තාගේ අයවීම් අය කරගත හැකි ප්‍රාථමික කාඩ්පත්හිමියකු නොවන වෙනත් තැනැත්තකු වේ.

(u) තෙවන පාර්ශවීය සැපයුම්කරු - කාඩ්පත මගින් පුළුල් ප්‍රතිලාභ සහ/හෝ සේවාවන් ලබාදීම සඳහා බැංකුව විසින් සම්බන්ධීකරණය කරන ලබන තෙවන පාර්ශවයන් අදහස් කෙරේ.

(v) ගෙවිය යුතු සම්පූර්ණ අවම මුදල - ගෙවිය යුතු අවම මුදල සහ අතීතයේ ගෙවිය යුතුව තිබූ මුදලේ එකතුව අදහස් කෙරේ. මෙය ගිණුම් ප්‍රකාශයේ වෙනම දක්වා තිබේ.

(w) සම්පූර්ණ හිඟ හිටවා ඇති මුදල - බැංකු වාර්තා වලට අනුව ගිණුම් ප්‍රකාශය නිකුත් කරන දිනට කාඩ්පත් ගිණුම යටතේ බැංකුවට ගෙවිය යුතු සම්පූර්ණ හර ශේෂය (කාඩ්පත් ගිණුමට හරකල හැකි සියලුම වියදම් ද ඇතුළුව) අදහස් කෙරේ.

(x) ගණුදෙනුව සිදු වූ දිනය - කාඩ්පත්හිමියකු සහ සේවා ආයතනයක් අතර ගණුදෙනුවක් සිදු වූ දිනය අදහස් කෙරේ.

## 02. <u>නියමයන් හා කොන්දේසීන් හි අදාලත්වය සහ ව්‍යවස්ථාවලට අනුකුලවීම.</u>

2.1 කාඩ්පත් හෝ කාඩ්පත් ගිණුම යටතේ යම් පුද්ගලයකුට බැංකුව විසින් ලබා දී ඇති සියලුම පහසුකම් මෙම ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසීන්ට සහ කලින් කලට බලපවත්වනු ලබන වෙනත් ඕනෑම වැඩසටහනක් යටතේ වන නියමයන්ට සහ කොන්දේසීන්ට යටත් වන අතර, ඒ බවට කාඩ්පත් හිමියා විසින් කාඩ් අයදුම්පත් පෝරමයට ඔහුගේ හෝ ඇයගේ අත්සන තබා පිළිගැනීම සහ/හෝ

කාඩ්පත් මත ඔහුගේ/ඇයගේ අත්සන තැබීම හෝ කාඩ්පත භාවිතා කිරීම මගින් ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් වේ.

2.2 කාඩ්පත භාවිතය ශ්‍රී ලංකාවේ අදාලවන නීතීන්ට සහ අදාල විනිමය පාලන රෙගුලාසීන්ට සහ කලින් කලට සංශෝධනය වන ප්‍රතිපත්ති සහ රෙගුලාසීන්ට දැඩි ලෙස අනුකූල විය යුතු ය.

2.3 කාඩ්පත්හිමියන් විසින් වාණිජ්‍ය ප්‍රමාණයන්ගේ හෝ ප්‍රාග්ධන ගණුදෙනු සඳහා වන මිලදී ගැනීම් වලට සහ/හෝ ආනයනය කිරීම් සඳහා කාඩ්පත භාවිතා නොකළ යුතු ය.

2.4 විදේශ විනිමය ඉලෙක්ට්‍රොනික් හුවමාරු (EFT) හෝ ATM යන්ත්‍ර මගින් ආපසු ගැනීම සඳහා කාඩ්පත භාවිතා කිරීම අවශ්‍ය වන අවස්ථාවක අදාල ගණුදෙනු විනිමය පාලන දෙපාර්තුමේන්තුව මගින් කලින් කලට නිකුත් කරන ලද රෙගුලාසීන්ට යටත් වන අතර, ඒවා බලය ලබා දුන් අරමුණු සඳහා පමණක් භාවිතා කළ හැක.

2.5 බැංකුව විනිමය පාලක හෝ වෙනත් පාලන අධිකාරියක් මගින් කලින් කලට නියම කරනු ලබන අවශ්‍යතාවලට අනුකූලවන අතර අදාල ගණුදෙනු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අදාල අධිකාරීන්ට ලංකාවේ බලපවත්නා නීතීන් සහ ප්‍රතිපාදයන් යටතේ කරුණු අනාවරණය කරනු ඇත.

2.6 විනිමය පාලන රෙගුලාසීන් හෝ වෙනත් ව්‍යවස්ථාපිත රෙගුලාසීන් උල්ලංඝනය කරනු ලැබ ඇති බවට විශ්වාසය තැබිය හැකි කිසිදු ආකාරයේ යම් හේතුවක් බැංකුව සතු වන විට බැංකුවට සිය අභිමතය පරිදි කාඩ්පත් සාමාජිකයන්ට දැනුම් දීමකින් තොරව කාඩ්පත් අවලංගු කළ හැකි ය.

03. <u>කාඩ්පත් සේවාවන්</u>

කාඩ්පත් අන් අයකුට පැවරිය නොහැකි අතර, එය භාවිතා කිරීම මෙම ගිවිසුමේ හා බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් නියමයන්ට යටත් වේ. කාඩ්පත් ලද වහාම කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පතෙහි අනිත් පස අත්සන් තැබිය යුතු අතර, කාඩ්පත මත තබන අත්සන අයදුම්පත් පෝරමයේ සඳහන් වන අත්සනට සමාන විය යුතු ය.

04. <u>කාඩ්පත භාර දීම.</u>

කාඩ්පත කුරියර් කිරීම, ලියාපදිංචි තැපැල් මගින් යැවීම හෝ කාඩ්පත්හිමියන්, අතිරේක කාඩ්පත්හිමියන් හෝ බලයලත් තෙවන පාර්ශවයක් විසින් බැංකු කවුන්ටරයට පැමිණ ලබාගැනීම කළහැක. ප්‍රාථමික කාඩ්පත්හිමියකු හෝ අතිරේක කාඩ්පත්හිමියකු විසින් කාඩ්පත ලද පසු ඔහු හෝ ඇය සිය අනන්‍යතාව ඉදිරිපත් කළයුතු අතර, දැනුම් දීමේ පත්‍රිකාව යථා පරිදි අත්සන් කිරීම මගින් කාඩ්පත ලද බව වහාම දැනුම් දිය යුතු ය. කාඩ්පත්හිමියකු ඔහුගේ හෝ ඇයගේ අභිමතය පරිදි ඔහු හෝ ඇය වෙනුවෙන් කාඩ්පත භාරගැනීම හෝ එකතු කිරීම සඳහා තෙවන පාර්ශවයකට ලිඛිතව බලය පැවරිය හැකි අතර, කාඩ්පත්හිමියා හෝ ඔහු හෝ ඇය වෙනුවෙන් එය භාරගැනීමට බලයලත් තැනැත්තා කාඩ්පත භාරගන්නා අවස්ථාවේදී කාඩ්පත් වෙනුවෙන් දරන ලද සියලු වියදම් ගෙවීමට බැඳී සිටී. බැංකුව විසින් සිය අභිමතය පරිදි බැංකුව විසින්ම තීරණය කනු ලබන කාඩ්පත්හිමියාගේ නියෝජිතයෙක් වන තෙවන පාර්ශවයකට හෝ නියෝජිතයෙකුට කාඩ්පත භාරදිය හැක. එලෙස කාඩ්පත භාරදෙන අවස්ථාවේ දී කාඩ්පත මත වන වියදම් දැරීමට කාඩ්පත්හිමියා බැඳී සිටී.

05. <u>කාඩ්පත භාවිතා කිරීම.</u>

5.1 කාඩ්පත සර්වභෞමිකව වලංගු වේ. කෙසේ වුව ද කිසියම් හේතුවක් මත යම්කිසි සේවා සැපයුම් ආයතනයක දී කාඩ්පත භාවිතා කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සහ අදාළ සේවා සැපයුම් ආයතන රඳවා තබා ගනී. කාඩ්පත භාවිතා කළ හැක්කේ සද්භාවී පෞද්ගලික හෝ කාර්යාලීය අරමුණු සඳහා පමණක් වන අතර, කාඩ්පත්හිමියාගේ ව්‍යාපාරික කටයුතු වලදී වාණිජ්‍ය පරමාර්ථයක් උදෙසා කාඩ්පත අයුතු ලෙස ප්‍රයෝජනයට ගත නොහැක. සමහර සේවා සැපයුම් ආයතනවල දී දරන ලද වියදම් මිල දී ගැනීම් හෝ වෙනත් පහසුකම් ලබාගැනීම සඳහා වන අය කිරීම් ද ඇතුළත් විය හැකි බවට පැහැදිලි කෙරේ.

5.2 කාඩ්පත්හිමියා විසින් සැම විටම ඔහුගේ රහස්‍ය අංකය රහසිගතව සහ වෙන් වශයෙන් තබා ගත යුතු අතර, කාඩ්පත ආරක්ෂිත ස්ථානයක් තබා ගැනීමට සහ වෙනත් පුද්ගලයකු විසින් භාවිතා නොකරන බවට සහතික විය යුතු සියලු ගණුදෙනු වල වගකීම කාඩ්පත් සාමාජිකයා දැරිය යුතුය.

5.3 කාඩ්පත සේවා ආයතනයක දී භාවිතා කරන අවස්ථාවක දී කාඩ්පත්හිමියා විසින් අයකිරීම් පත්‍රිකාව අත්සන් කිරීමෙන් පසුව එහි පිටපත් ලබා ගත යුතු ය. සාමාන්‍යයෙන් බැංකුව විසින් වෙනත් අය කිරීම් පත්‍රිකා වල පිටපත් කාඩ්පත් සාමාජිකයාට ලබානොදේ. කෙසේ වුව ද, බැංකුවේ පූර්ණ අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරන අතිරේක ගාස්තු ගෙවීමෙන් පිටපත් ලබා දෙනු ඇත.

5.4 බැංකුව විසින් තෝරා ගනු ලැබූ විද්‍යුත් තැපැල් මඟින් ඇණවුම් කරන හෝ දුරකථන මඟින් ඇණවුම් කරන හෝ අන්තර්ජාල භාවිතය මඟින් කරන ඇතැම් ගනුදෙනු සිදුකිරීමේ පහසුකම කාඩ්පත්හිමියන්ට ලැබෙන බව කාඩ්පත්හිමියා පිළිගන්නා අතර, එවැනි අවස්ථාවක දී කාඩ්පත භාවිතා කිරීමේ දී කාඩ්පත්හිමියා විසින් අයකිරීම් පත්‍රිකාව අත්සන් නොකරනු ඇත. එවැනි මිල දී ගැනීමක් හෝ අය කිරීමක නිර්ව්‍යාජත්වය හෝ වලංගුභාවය පිළිබඳව ආරවුලක් ඇති විටක දී පවා අදාල හිඟ මුදල ගෙවීමට කාඩ්පත්හිමියා එකඟ වේ. එවැනි ආරවුලක් කාඩ්පත්හිමියා සහ අදාළ සේවා සැපයුම්කරු අතර වන කාරණයක් වන අතර, කාඩ්පත්හිමියා සහ අදාල සේවා සැපයුම් ආයතනය විසින් නිරාකරණය කරගනු ලැබිය යුතු කාරණයක් වේ. ඒ සම්බන්ධයෙන් කිසිම ආකාරයකට බැංකු වගකියනු නොලැබේ.

5.5 කාඩ්පත් බැංකුව විසින් කාඩ්පත්හිමියාට දැනුම් දෙනු ලබන මූල්‍ය සීමාවන් තුළ මුහුණතෙහි දක්වා ඇති මාසයේ අවසාන දින හෝ එයට පෙර පමණක් කාඩ්පත භාවිතා කළ යුතු වේ.

5.6 කාඩ්පත්හිමියා විසින් බැංකුවට ලිඛිතව දැනුම් දෙන කාලයක් සඳහා කාඩ්පත් අළුත් කිරීම සහ/හෝ නැවත කාඩ්පත් ලබාදීමට බැංකුවට පූර්ණ අභිමතයක් ඇති බවට කාඩ්පත්හිමියා එකඟ වේ. කාඩ්පත් කල් ඉකුත් වීමේදී, නැතිවීමේ දී, හානිවීමේ දී, සොරකම් කරනු ලැබ ඇති විටෙක නැවත අළුත් කිරීම හෝ ලබාදීමේ පූර්ණ අයිතිය බැංකුව විසින් රඳවා තබාගනී. කාඩ්පත නැවත අළුත් නොකරන අවස්ථාවක කිසිදු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ හිඟ මුදල් කාඩ්පත්හිමියා විසින් බැංකුවට ඉතා ඉක්මණින් ගෙවිය යුතු වේ.

5.7 කාඩ්පත්හිමියා කාඩ්පත සමඟ සම්බන්ධවන සියලුම ගණුදෙනු වලදී බැංකුව සමඟ උපරිම විශ්වාසයෙන් කටයුතු කිරීමට ප්‍රතිඥා දේ.

5.8 කිසිදු හේතු දැක්වීමකින් තොරව මූල්‍ය සීමාව අත්හිටුවීමේ හෝ අඩු කිරීමේ සහ කාඩ්පත මත වන යම් විශේෂ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අභිමතය සහ නිදහස බැංකුව විසින් රඳවා තබාගනී. බැංකුව එවැනි මූල්‍ය සීමාව අත්හිටුවීම හෝ අඩු කිරීම නිසා කාඩ්පත්හිමියන්ට උද්ගත විය හැකි යම් පාඩු හා අලාභ සම්බන්ධයෙන් වගකීමක් නැත.

## 06. ගිවිසුම උල්ලංඝනය කිරීම.

කාඩ්පත්හිමියකු විසින් මෙම ගිවිසුම උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක,

(එ) මෙම ගිවිසුමේ දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අමතරව එවැනි උල්ලංඝනය කිරීමක් නිසා බැංකුවට ඍජුව හෝ වක්‍රව සිදුවන යම් පාඩුවක් හෝ වෙතොත් එය කාඩ්පත්හිමියා විසින් ප්‍රතිපූරණය කළ යුතු ය.

(බී) කාඩ්පත්හිමියාගෙන් බැංකුවට අයවිය යුතු සම්පූර්ණ හිඟ මුදල ගෙවන ලෙසට විධාන කළ විටෙක එසේ විධාන කළ දිනට අය විය යුතුව හා ගෙවිය යුතුව ඇති මුදල ගෙවීමට කාඩ්පත්හිමියා වගකීමට බැඳේ.

## 07. කාඩ්පත් පහසුකම් අත්හිටුවීම.

7.1 කාඩ්පත්හිමියාට ඕනෑම අවස්ථාවක දී කාඩ්පත් පහසුකම අවසන් කරන ලෙසට බැංකුවට කරන ලිඛිත දැනුම් දීමක් මඟින් ඉල්ලා සිටිය හැක. එහි දී ප්‍රාථමික කාඩ්පතෙහි සහ අතිරේක කාඩ්පත නැවත භාර දිය යුතු ය.

7.2 කාඩ්පතෙහි චුම්භක කොටස කැපී යන පරිද්දෙන් කොටස් 04 කට කපා, එකී කොටස් බැංකුව වෙත ලද බව තහවුරු කරන තෙක් එවැනි දැනුම් දීමක් වලංගු වන්නේ නැත.

7.3 ඉහත දැක් වූ ආකාරය හැර කාඩ්පත්හිමියකුට කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම අවසන් කළ නොහැක.

7.4 කාඩ්පත විනාශ කිරීමෙන් පසුව කාඩ්පත මත යම් ගෙවීමක් සිදු කරනු ලැබූ විට එය අයථා භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූව ද, නොවූව ද, හෝ බැංකුවට දැනුම් දීමක් කර තිබුණ ද නොතිබුණ ද එවැනි ගෙවීම් සඳහා කාඩ්පත්හිමියා සම්පූර්ණ වගකීමට බැඳේ. බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දැනුම් දීමක් සහිතව හෝ රහිතව අවස්ථානුගත තත්ත්වයන් මත බැංකුවේ අභිමතය පරිදි කාඩ්පත අවසන් කළ හැකි ය.

7.5 කාඩ්පත අවසන් කිරීමේ දී බැංකුව සහ කාඩ්පත්හිමියා අතර වූ මෙයට පටහැනි කිසියම් පූර්ව එකඟතාවක් තිබුණ ද,

(අ) කාඩ්පත භාවිතා කිරීමට කාඩ්පත්හිමියාට ඇති අයිතිය ඉක්මනින් නැති වනු ඇත.

(ආ) ගිණුම් ප්‍රකාශයෙහි දැනටමත් පිළිඹිබු වුව ද, නොවුව ද, ඒ වන විට හිඟව ඇති සම්පූර්ණ මුදල මෙන්ම අවසන් කිරීමෙන් පසුව සිදු කරන ලද වෙනත් ගෙවීම් සහ කාඩ්පත් අවසන් කිරීමෙන් පසුව කරන ලද වියදම් ද (අදාළ ගණුදෙනු සිදු වූ දින සිට බලපැවැත්වෙන පරිදි) සහ ඒ මත අදාළ වන පොලිය ද, කාඩ්පත්හිමියා විසින් ගෙවිය යුතු ය.

7.6 කාඩ්පත් ගිණුමේ හිඟ හිටුවා ඇති සම්පූර්ණ ශේෂය සහ කාඩ්පත් ගණුදෙනු මත හිඟ හිටුවා ඇති නමුත් ඒ වන විට කාඩ්පත් ගිණුමට අය කර ගෙන නොමැති මුදල් මෙම ගිවිසුම අවසන් වීමෙන් හෝ කාඩ්පත්හිමියා බුන්වත්භාවයට පත්වීමෙන් හෝ මියයාමෙන් ඉතා ඉක්මණින් අය විය යුතුව සහ ගෙවිය යුතු බවට පත්වේ. කාඩ්පත්හිමියා හෝ ඔහුගේ දේපල කාඩ්පත් ගිණුමේ වන එවැනි හිඟ මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකීමට යටත් වන අතර, එවැනි හිඟ මුදලක් නැවත අය කර ගැනීමේ දී දරන්නට සිදු වූ සියලු වියදම් හා ගාස්තු (නීති ගාස්තු ද ඇතුළත්ව) බැංකුවට ප්‍රතිපූරණය කළ යුතු වේ. එවැනි නැවත ගෙවීමක් පවතින අතරතුර දී මූල්‍යමය වියදම් සහ ගාස්තු තත්කාලීනව බලපවත්නා අනුපාතයන්ට යටත්ව ඉදිරියට අයකරගැනීමට බැංකුවට හිමිකම් ලැබේ.

7.7 මෙම ගිවිසුම කුමන පාර්ශවයන් විසින් හෝ අවසන් කිරීම සිදුකළ ද කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිතය මඟින් සිදු කරන වෙනත් වියදම් ගෙවීමට තව දුරටත් වගකීමට බැඳේ.

08. විදේශයක දී කාඩ්පත භාවිතය

කාඩ්පත ජාත්‍යන්තර සේවා සැපයුම් ආයතනවලදී වලංගු වන අතර, එහි භාවිතය ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නිර්දේශයන් මඟින් දක්වා ඇති සීමාවන් ඉක්මවා ගිය හොත් එවැනි විටෙක CBSL හි අවසරය ලබා ගැනීමට කාඩ්පත්හිමියා ප්‍රතිඥා දේ. කෙසේ වුව ද කිසිඳු අවස්ථාවක් යටතේ වැඩිදුර මුදල් ලබා ගැනීමේ පදනම මත පිහිටා නැවත ගෙවීම ප්‍රමාද කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතු ය.

09. විදේශයක කටයුතු කරන කාඩ්පත්හිමියන්

පූර්ණ කාලීන සේවා නියුක්තිකයකු වශයෙන් විදේශගත වන හෝ ක්‍රියා කරන විනිමය පාලන රෙගුලාසීන් යටතේ අනේවාසික පුරවැසියකු වශයෙන් සලකනු ලබන කාඩ්පත්හිමියකු ඒ බැව් බැංකුවට ලිඛිතව දැනුම් දිය යුතු අතර, බිල් කරන ලද සහ නොකරන ලද ගෙවීම ද සමග ප්‍රාථමික කාඩ්පත සහ අතිරේකව වන කාඩ්පත් ද බැංකුවට භාර දිය යුතු ය.

10. ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන අයට කාඩ්පත් **(NRSL)**

CBSL මඟින් නිකුත් කර ඇති දැනට බලපවත්නා නිර්දේශයන් මත NRSL හට කාඩ්පත් භාවිතය කළ නොහැක. එවැනි අවස්ථාවක කාඩ්පත්හිමියා ප්‍රාථමික කාඩ්පත සහ අතිරේක කාඩ්පත බැංකුවට ආපසු ලබා දිය යුතු ය.

11. විදේශීය ජාතිකයන් සහ කාඩ්පත්

විදේශීය ජාතික කාඩ්පත්හිමියකු ඔහු/ඇය ලංකාවේ පදිංචිව සිටිනම් කාඩ්පත භාවිතා කළ හැක. එවැනි විදේශීය ජාතික කාඩ්පත්හිමියකු විසින් ඔහු හෝ ඇය ස්ථිර වශයෙන් රට හැර යන්නේ නම් සහ/හෝ ඔහුගේ හෝ ඇයගේ නේවාසික වීසා අවසන් වීමට මාසයකට පෙර ඒ බව බැංකුවට ලිඛිතව දැනුම් දිය යුතු ය. ඔහු/ඇය බිල් කරන ලද හෝ නොකරන ලද වියදම් සම්පූර්ණයෙන්ම පියවිය යුතු අතර ඉහත දැක් වූ අවස්ථාවන් හි එකක් හෝ සිදුවීමට පෙර සිය කාඩ්පත බැංකුවට පවරා දිය යුතු ය.

12. විදේශ විනිමය මඟින් කරනු ලබන වියදම්

ශ්‍රී ලංකා රුපියල් වලින් නොවන වෙනත් විදේශ විනිමය මඟින් කරනු ලබන ගණුදෙනු බැංකුව විසින් තීරණය කරන හුවමාරු අනුපාතිකයන් යටතේ ශ්‍රී ලංකා මුදලට පරිවර්තනය කිරීමෙන් අනතුරුව ගිණුමට බැරවනු ඇත.

(1) ඇමරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් නොවන වෙනත් විදේශ විනිමයක් මඟින් කරනු ලබන ගෙවීමක් නේෂන් ට්‍රස්ට් මාස්ටර් කාඩ් මඟින් පරිවර්තනය කිරීමේ දී බිල්ගත කරන විනිමයට පරිවර්තනය කිරීමට පෙර ඇමරිකානු එක්සත් ජනපද ඩොලර්වලට පරිවර්තනය කෙරේ. නේෂන් ට්‍රස්ට් මාස්ටර් කාඩ් විදේශ ගෙවීම් සඳහා පරිවර්තනය ගෙවීමේ දී 1.5% පරිවර්තිත ගාස්තුවක් පරිවර්තිත මුදලට එකතු කරනු ලැබේ. බැංකුව විසින් සියලු එතෙර ගණුදෙනු තත්කාලීනව පවත්වාගෙන යනු ලබන විනිමය අනුපාතිකයන්ට අනුව බිල් කරන මුදලට පරිවර්තනය කෙරේ.

13. <u>මූල්‍ය ණය</u>

13.1 කාඩ්පත්හිමියා විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) හෝ බැංකු ශාඛා හෝ මුදල් ලබා දෙන වෙළඳුන් හෝ නියෝජිතයන්ගෙන් ලබාගන්නා මූල්‍ය ණය (ATMs) බැංකු දේශීය හෝ ප්‍රාදේශී සීමාවන්ට යටත් වේ. මහ බැංකුවේ සහ විනිමය පාලන දෙපාර්තුමේන්තුවේ රෙගුලාසීන් ද අදාළ වේ. කාඩ්පත්හිමියන්ට (ATMs) මගින් බැංකු විසින් නිකුත් කරන ඇති සිය රහස්‍ය අංකය භාවිතා කරන්නේ නම් මිස මුදල් ලබා ගත නොහැක.

13.2 කාඩ්පත්හිමියන්ට මුදල් අත්තිකාරම් ලබාගත හැක්කේ මුදල් අත්තිකාරම් සීමාවන් දක්වා පමණි. තාවකාලිකව ණය සීමාව වැඩි කිරීම් සහ/හෝ මුදල් තැන්පතු කිරීම් හෝ කාඩ් ගිණුම් වලට මුදල් පැවරීම් මූල්‍ය ණය සීමාව කිසිවිටෙක වැඩි කරන්නේ නැත.

13.3 මෙකී පහසුකම් කාඩ්පත්හිමියාට පූර්ව දැනුම් දීමකින් තොරව බැංකුව විසින් වෙනස් කරනු ලැබිය හැකි හෝ ආපසු ගනු ලැබිය හැකි ය.

14. <u>මූල්‍ය සීමාවන්</u>

කාඩ්පත සමඟ වන ආවරණ ලිපියෙහි මෙන්ම ගිණුම් ප්‍රකාශයෙහි ද, කාඩ්පත්හිමියාගේ ගිණුමට අදාළ වන මූලික මූල්‍ය ණය සීමාව පෙන්නුම් කෙරේ. බැංකුව විසින් මූල්‍ය සීමාව තීරණයකර ඒ බව කාඩ්පත්හිමියාට කලින් කලට දැනුම් දෙනු ඇත. වර්තමාන ශේෂය මූල්‍ය සීමාව ඉක්මවා යන්නේ නම් කාඩ්පත්හිමියා එවැනි අතිරික්ත මුදල් කඩිනමින් ගෙවිය යුතු ය. සීමාව ඉක්මවා තිබුණහොත් කලින් කලට සීමාව ඉක්මවීම මත වන දඩයක් කාඩ් ගිණුමෙන් අය කර ගනු ඇත.

15. <u>කාඩ්පත් කල් ඉකුත් වීම.</u>

කාඩ්පත එහි මුහුණතෙහි මුද්‍රණය කර ඇති කල් ඉකුත්වීමේ දිනය තෙක් වලංගු වනු ඇත. කාඩ්පතෙහි වලංගුතාවය නැවත අළුත් කිරීම 5.6 වගන්තියෙහි දක්වා ඇති ආකාරයට වේ.

16. <u>කාඩ්පත බැංකුවේ දේපලක්ව පවතී.</u>

කාඩ්පත බැංකුව සතු දේපලක්ව පවතින අතර, එයට ප්‍රාථමික කාඩ්පත්හිමියකුගේ හෝ වෙනත් අතිරේක කාඩ්පත් හිමියකුගේ කාඩ්පත භාවිතා කිරීමේ අයිතිය ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැක. බැංකුවට මෙම අයිතිය කාඩ්පත්හිමියාට දැනුම් දීමක් කර හෝ නොකර සහ හේතුවක් දක්වා හෝ නොදක්වා ක්‍රියාත්මක කළ හැක. බැංකුව අවලංගු කරන ලද කාඩ්පත් "Cancellation Bulletin" හි ලැයිස්තු ගත කරයි. නොඑසේ නම් සේවා සැපයුම් ආයතන වලට කාඩ්පත ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු කළ බවට දැනුම් දේ.

බැංකුව කාඩ්පත ප්‍රත්‍යාදිෂ්ට කරන්නේ නම් කාඩ්පත්හිමියා කාඩ්පත බැංකුවට ආපසු භාරදිය යුතුය. එසේම සේවා සැපයීමේ ආයතනයක් විසින් කාඩ්පත්හිමියෙකු හට කල් ඉකුත් වූ හෝ ප්‍රත්‍යදේෂ්ට කරන ලද කාඩ්පතක් භාරදෙන ලෙසට ඉල්ලා සිටියහොත් කාඩ්පත්හිමියා විසින් එසේ කළ යුතුය. කාඩ්පත්හිමියා කාඩ්පත් කල් ඉකුත් වූ පසුව හෝ එය ප්‍රත්‍යදේෂ්ට කිරීමෙන් පසුව භාවිතා නොකළ යුතුය. කාඩ්පත ප්‍රත්‍යදේෂ්ට කිරීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් පසුව කරන ලද සියලු ගෙවීම් වලට කාඩ්පත්හිමියා තවදුරටත් වගකීමෙන් බැඳේ.

බැංකුව කාඩ්පත ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැවත සන්තකයට ගැනීම, ආපසු භාර දෙන ලෙසට ඉල්ලා සිටීම කාඩ්පත්හිමියාගේ චරිතය හෝ විශ්වසනීයත්වය පිළිබඳ කිසිඳු පිළිබිඹුවක් නොකරන අතර, බැංකුව කිසිඳු

ආකාරයෙන් වෙනත් පුද්ගලයකු විසින් කාඩ්පත ආපසු හෝ භාරදෙන ලෙසට ඉල්ලමින් කරන කිසිඳු ප්‍රකාශයකට වගකීමක් නොමැත.

තවදුරටත් කාඩ්පත සමඟ වන වරප්‍රසාද සහ පහසුකම් බැංකුවේ පූර්ණ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක කාඩ්පත්හිමියාට දැනුම් දීමකින් තොරව හෝ එයට කිසියම් හේතුවක් නොදක්වා ඉල්ලා අස්කර ගත හැක.

17. අය කිරීම්

17.1 බැංකුවේ ඉල්ලීම පරිදි කාඩ්පත නිකුත් කිරීමේ දී සහ බැංකුව විසින් නිකුත් කරන සෑම අතිරේක කාඩ්පතකටම බැංකුව විසින් නියම කරන සම්බන්ධිත මුදලක් ගෙවීමට කාඩ්පත්හිමියා එකඟ වේ.

17.2 කාඩ්පත භාවිතා කිරීමට වාර්ෂික ගාස්තු ගෙවිය යුතු අතර කාඩ්පත්හිමියාට බැංකුව විසින් දැනුම් දෙනු ලබන අනුපාතිකයක් යටතේ ඉදිරියට බිල් කළ හැක.

17.3 කාඩ්පත එතෙර ලිපිනයකට කුරියර් කළ විටක බැංකු විසින් කාඩ් ගිණුමකට සම්බන්ධිත ගාස්තුවක් හර කරනු ඇත.

17.4 මූල්‍ය සීමාවන් වැඩි කිරීමේ සම්බන්ධිත ගාස්තුව කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

17.5 ගිණුම් ප්‍රකාශයන් හි පිටපත් වලට සම්බන්ධිත ගාස්තුව  කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

17.6 කාඩ්පත්හිමියකු විසින් ගෙවිය යුතු දිනට සම්පූර්ණ හිඟ හිටවා ඇති මුදල නොගෙවන්නේ නම් ගිණුම් ප්‍රකාශයේ දිනට සම්පූර්ණ හිඟ හිටවා ඇති ශේෂයට මූල්‍ය අය කිරීමක් එකතු වන අතර, එය බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතිකයකට ගණනය කරනු ලබන කාල සීමාවේ දෛනික ශේෂයට ගණනය කරනු ඇත. මූල්‍යමය අය කිරීම් මීළඟ ගිණුම් ප්‍රකාශයේ දිනට කාඩ්පත් ගිණුමට හරවනු ඇත.

17.7 ඉහත 17.6 වගන්තියේ සඳහන් කළ මූල්‍ය අය කිරීම් ගෙවීමට අගති රහිතව කාඩ්පත්හිමියා විසින් අවම ගෙවිය යුතු මුදල ගෙවීම් කළ යුතු දිනට ගෙවිය යුතු සම්පූර්ණ අවම මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම් ඒවා බැංකු විසින් නියම කරනු ලබන අනුපාතිකයකට කාඩ්පත් ගිණුමට හරවනු ඇත.

17.8 කාඩ්පත්හිමියා විසින් නිකුත් කර ඉදිරිපත් කරන හෝ වෙනත් පාර්ශවයක් විසින් බැංකුවට ඉදිරිපත් කරන චෙක්පතක් හෝ වෙනත් ගෙවීම් ආඥාවක් කිසියම් හේතුවක් නොමැතිව අගරු වන්නේ නම් බැංකුව කාඩ්පත්හිමියාගෙන්, බැංකුව විසින් නියම කරනු ලබන අනුපාතිකයකට කාඩ්පත් ගිණුමට හරවනු ඇත. මෙම අය කිරීම් බැංකුව විසින් අය කරනු ලබන තැපැල් ගාස්තු වලට ද අමතරව වේ.

17.9 සියළු මූල්‍ය අත්තිකාරම් වලින් මූල්‍ය අත්තිකාරම් මුදලක් සහ/හෝ සම්බන්ධිත ගාස්තුවක් බැංකුව විසින් නියම කරනු ලබන අනුපාතිකයකට කාඩ්පත් ගිණුමට හරවනු ඇත. කාඩ්පත මගින් මිලදී ගන්නා මුදල් බවට පහසුවෙන් පත් කළ හැකි සංචාරක චෙක්පත්, විධාන කෙටුම්පත්, ටෙලිග්‍රැෆික් පැවරුම් වැනි සාධන පත්‍ර මුදල් අත්තිකාරම් වශයෙන් සළකන අතර ඉහත අයකිරීම් වලට යටත් වේ.

17.10 ගණනය කරනු ලබන කිසියම් අවස්ථාවක නියම කර ඇති මූල්‍ය සීමාව ඉක්මවුවහොත් සීමාව ඉක්මවා යෑමේ අය කිරීමක් කාඩ්පත් ගිණුමෙන් හරවනු ඇත. එය එක් ගිණුම් කාලයකට අය කෙරේ. මූල්‍ය සීමාව ඉක්මවා ඇද්ද නැද්ද යන්න ගණනය කිරීමේ අරමුණ සඳහා බැංකුව විසින් කරනු ලබන එවැනි අය කිරීම් ද සලකා බලනු ලැබේ.

17.11 විකුණුම්/මුදල් අත්තිකාරම් කෙටුම්පත්, ඡායා පිටපත්වලට බැංකුව විසින් තීරණය කරන අනුපාතිකයකට සමුද්ධරණ ගාස්තුවක් (retrieval fee) කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

17.12 කලින් කලට අදාළ වන ව්‍යස්ථාපිත ගෙවීම් වෙතොත් කාඩ්පත්හිමියාගේ කාඩ්පත් ගිණුමෙන් එය අය කෙරේ.

17.13 බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන බදු පිළිබඳ පෙතෙහි මූල්‍ය අය කිරීම් වල විස්තර සහ කාඩ්පත් වලට සහ කාඩ්පත් භාවිතා කිරීමේ දී අදාළ වන අනෙකුත් ගාස්තු සහ අය කිරීම් පිළිබඳව සඳහන් වන අතර එකී පොත්වල පිටපත් ලංකාවේ ඕනෑම බැංකු ශාඛාවකින් සහ කාඩ්පත් මධ්‍යස්ථානයකින් ඉල්ලා ලබාගත හැකි ය. සියලු අයකිරීම් ගාස්තු පොලී අනුපාතිකයන් දඩ බැංකුවේ පූර්ණ අභිමතය මත දැනුම් දීමකින් තොරව වෙනස් කිරීමට හැකි අතර, බදු පිළිබඳව එවැනි වෙනස් කිරීම්/එකතු කිරීම් ගිණුම් ප්‍රකාශය සමඟ විස්තරාත්මකව ඇමුණුමක් මඟින් හෝ ලංකාවේ පළ කරනු ලබන පුවත්පත් එකක් හෝ කිහිපයක මුද්‍රණය කොට කාඩ්පත්හිමියන්ට දැනුම් දෙනු ඇත.

17.14 කාඩ්පත්හිමියකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව කරන අමතර සේවාවකට අදාළව ගාස්තුවක් අය කර ගැනීමේ අයිතිය බැංකුව රඳවා තබා ගන්නා අතර එවැනි ගාස්තුවක් සම්බන්ධයෙන් කාඩ්පත් ගිණුම හර කළ හැක.

17.15 බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන කිසියම් ගාස්තු අඩු කිරීමක් හෝ නොසළකා හැරීමක් බැංකුව සිය අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්කර ගැනීමකට හෝ පාලනය කළ හැක. බැංකුව සිය අභිමතය පරිදි කාඩ්පත් වර්ගය සහ අවස්ථානුගත කරුණු මත ඇතැම් ගාස්තු මුක්ත කළ හැක.

18. <u>ගුවන් සේවාවන් සමඟ වන ගණුදෙනු</u>

කාඩ්පත භාවිතා කිරීම මඟින් ගුවන් ප්‍රවේශ පත්‍රයක් වෙන් කරවා ගත් විටක කාඩ්පත්හිමියාට ගුවන් ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීමට අදාළ මුදල් අතිරේක ගාස්තුවක් වෙතොත් එය ද ගෙවීමට යටත්ව සිදු වන අතර, එය ගිණුම් ප්‍රකාශයෙහි බිල් කරනු ඇත. පසුව අවලංගු කරනු ලබන යම් ප්‍රවේශ පත්‍රයකට අදාළව සේවා සැපයුම් ආයතනය වෙත අදාළ මුදල් ලැබුණු පසු එම මුදල් කාඩ් ගිණුමට බැර වේ. (අවලංගු කිරීමේ ගාස්තු අඩු කොට)

19. <u>ආරවුල්</u>

බැංකු සේවා ආයතනයකින් කිසියම් වියදම් හෝ ගෙවීම් අයදුම් පතක් ලැබුණු විට 27(1) සහ 27(2) වගන්තීන් යටතේ කාඩ්පත් නැති වූ සොරකම් කරන ලද බැව් නිසි පරිදි දන්වා ඇති විටෙක හැර එවැනි අයදුම්පතක වාර්තා කර ඇති වියදම් කාඩ්පත්හිමියා විසින් කාඩ්පත මඟින් දරන ලද බවට නිශ්චිතව සාක්ෂියක් වේ. කාඩ්පත වංචනික ලෙස භාවිතා කරන ලද බවට ඔප්පු කිරීම කාඩ්පත්හිමියා සතු වේ. මෙම වගන්තියේ සඳහන් වන වෙනත් ගෙවීමේ ඉල්ලීම් කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිතය මඟින් සේවා සැපයුම් ආයතනයක දී දරන ලද අනිත් සහ සියලු සහ අනුමත වියදම් වන අතර ඒ යටතේ අය කිරීමක් ලෙස සඳහන් නොවන විවිධ හොටල් ගාස්තු ආදිය වේ. එවැනි ගෙවීම් පත්‍රිකාවක් මත කාඩ්පත් සාමාජිකයාගේ අත්සන සමඟ කාඩ්පත් සාමාජික අංකය සඳහන් කොට ඇත්නම් එය කාඩ්පත්හිමියා දරනු ලබන වගකීම් ප්‍රමාණය පිළිබඳව බැංකුව සහ කාඩ්පත්හිමියා අතර, අවසානාත්මක සාක්ෂියක් වන අතර බැංකුව විසින් කාඩ්පත්හිමියා මිල දී ගත්/මිල දී ගැනීමට වන භාණ්ඩ නිසි පරිදි ලැබුණේ ද හෝ කාඩ්පත්හිමියා තෘප්තිමත් වන ආකාරයට ලද සේවාව හෝ ලැබීමට ඇති සේවාව නිසි පරිදි ලැබුණේ ද යන්න තහවුරු කිරීම අවශ්‍ය වන්නේ නැත. ප්‍රකාශනයේ සඳහන් යම් ගාස්තුවක් සම්බන්ධයෙන් කාඩ්පත්හිමියා එකඟ නොවන විටක දී ඒ බව ප්‍රකාශනය ලැබී දින 20 ක් තුළ දී බැංකුවට දැනුම් දිය යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වීම මත සියලු ගාස්තු සහ ප්‍රකාශන සම්පූර්ණයෙන් විධිමත් බවට අර්ථ නිරූපණය කරනු ඇත. ගෙවන ලද/ගෙවීමට ඇති ගාස්තුවක් ලද/ලැබීමට වන සේවාවන් සම්බන්ධයෙන් කාඩ්පත්හිමියාගේ ගිණුමෙන් අය කිරීමට බලය සේවා සැපයුම් ආයතනයක දී භාවිතා කරන බැංකුව විසින් ලබා දෙන ගෙවීම් පත්‍රිකාවක් හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයකට විය හැක. කාඩ්පතහිමියා විසින් අනතුරුව කිසිදු විභ්‍රමයකින් තොරව පොලිය සහ අදාළ වෙනත් ගාස්තු ද සමඟ ගාස්තු ගෙවිය හැක.

20. <u>කාඩ්පත අගරු වීම.</u>

කිසියම් සේවා ආයතනයක් විසින් කාඩ්පත භාවිතා කිරීමට භාර ගැනීම සම්පන්ධයෙන් බැංකුව කිසිඳු වගකීමක් නොදරන අතර, කාඩ්පත භාර ගැනීමට කිසියම් සේවා සැපයුම් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීමේ වගකීම ද භාර ගන්නේ නැත.

21. <u>නම සහ ලිපිනය වෙනස් වීම.</u>

සෑම කාඩ්පත්හිමියෙක් විසින්ම සිය නම හෝ ලිපිනයෙ හි කිසියම් වෙනසක් වුවහොත් ඒ පිළිබඳව බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයකට ලිඛිතව දැනුම් දිය යුතු ය.

22. <u>භාණ්ඩ හා සේවා වල ගුණාත්මක භාවය</u>

සේවා ආයතනයකින් කාඩ්පත්හිමියෙකු තැපැල් ඇණවුමක් මගින් ලබාගන්නා අලෙවි, වොරන්ටි හෝ සේවා මිලදී ගැනීම සම්බන්ධයෙන් වන භාරදීමේ දී සිදුවන ප්‍රමාදයන්, භාරනොදීම සහ භාණ්ඩ නොලැබීම හෝ දෝෂ සහිත භාණ්ඩ ලැබීම් වලට බැංකුවේ වගකීමක් නැත. කාඩ්පත්හිමියෙකුට භාණ්ඩ මිල දී ගැනීමට හෝ සේවාවන් ලබාගැනීමට ලැබෙන පහසුකමක් වන අතර බැංකුව භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය, ප්‍රමාණාත්මක බව භාරදීම හෝ වෙනත් කාරණයක් සම්බන්ධයෙන් සේවා ආයතනයක් සමඟ කාඩ්පත්හිමියෙකු ඇතිවන ආරවුල් වලට බැංකුව වගකීමක් නොමැත.

23. <u>කාඩ්පත්හිමියන් සඳහා රක්ෂණ ආරක්ෂාව</u>

බැංකුව සිය අභිමතය පරිදි කාඩ්පත්හිමියෙකුට නොයෙක් රක්ෂණ නිෂ්පාදන වරින් වර ලබාදෙයි. කෙසේ වුව ද එවැනි රක්ෂණ පිළිබඳ හිමිකම් පෑම් අදාළ රක්ෂණ සපයන සමාගම් වෙත ඍජුව කළ යුතු ය. එවැනි රක්ෂණයක් මඟින් උද්ගත වන නොගෙවා සිටීමක් හෝ ආරවුලකට බැංකුව වග නොකියන අතර, එවැනි ගැටළු කාඩ්පත්හිමියා සහ රක්ෂණ සමාගම විසින් විසඳා ගත යුතු ය.

අදාළ රක්ෂණ, බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ඇති අතර, ඒවා බැංකුවේ අභිමතය පරිදි සංශෝධනය හෝ වෙනස් කෙරෙනු ඇත. විවිධ රක්ෂණ ප්‍රතිපත්තීන් සඳහා රක්ෂණ සමාගම විසින් තීරණය කරනු ලබන වෙනත් කොන්දේසීන් හා නියමයන් අදාළ වනු ඇත. නියමයන් හා කොන්දේසීන් සමඟ වන රක්ෂණ ප්‍රතිපත්ති ඉල්ලීම අනුව ලබා දෙනු ඇත.

24. <u>ගෙවිය යුතු අවම මුදල</u>

ගෙවිය යුතු අවම මුදල ප්‍රකාශනයෙහි දැක්වෙනු ඇත. මුදල් ප්‍රමාණය බැංකු විසින් කලින් කලට තීරණය කරනු ඇති අතර, එය ප්‍රකාශනයෙහි හෝ තීරණය හිඟ හිටවා ඇති මුදලෙහි අනුපාතයක් ලෙස (වඩා වැඩි මුදල) ගණනය කරනු ඇත. (ඉන් කුමක් වුව ද ගෙවිය යුතු අවසාන මුදල කාඩ්පත්හිමියා විසින් ගෙවිය යුතු දිනට හෝ ඊට ප්‍රථම බැංකුවට ගෙවිය යුතු ය. ගෙවීම සිදුවන්නේ බැංකුව ගෙවීම ලද විට දී සහ එම මුදල කාඩ්පත්හිමියාගේ ගිණුමට බැර කළ විට දී පමණක් වන අතර, කාඩ්පත්හිමියා එය පිටත් කොට යැවූ විට දී නොවේ.

අයිරාව හෝ මූල්‍ය සීමාව ඉක්මවා ගිය විටක කාඩ්පත්හිමියා විසින් බැංකුවට වහාම ගෙවීම අවශ්‍ය වන අතර, එය ප්‍රකාශනය මඟින් දැනුම් දෙනු ඇත. කාඩ්පත්හිමියා විසින් බැංකුවට සිදු කරන ගෙවීම, ගෙවිය යුතු අවම මුදලට

වඩා වැඩි විය හැකි හෝ ගෙවීම් කළ යුතු දිනට සිදු කිරීමට හෝ බිල් කරන කාලයේ දී එක් වරකට වඩා වැඩි විය හැක.

එවැනි ගෙවීම් ප්‍රකාශනයෙහි සඳහන් කර ඇති ආකාරයට ශ්‍රී ලංකා රුපියල් වලින් බැංකුවට ගෙවිය යුතු ය.

25. වගකීම් බැහැර කිරීම

බැංකුව සෘජුව හෝ වක්‍රාකාරයෙන් සිදු වන කිසියම් පාඩුවකට හෝ අලාභයක් සම්බන්ධයෙන් කාඩ්පත්හිමියාට කිසිදු වගකීමක් නොමැත.

(a) සපයන ලද භාණ්ඩ හෝ සේවාවක වන දෝෂ සම්බන්ධයෙන්

(b) කිසියම් පුද්ගලයකු විසින් කාඩ්පතට ගරු කිරීම හෝ භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම.

(c) කිසියම් පරිගණක පර්යන්තයක් සහ/හෝ EDB යන්ත්‍රයක් ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමෙන්

(d) කාඩ්පත්හිමියකු නොවන වෙනත් අයකු විසින් දෙනු ලබන ගණුදෙනු කිරීමේ උපදෙස් ලබාදීමේ දී

(e) කාඩ්පත ආපසු එවන ලෙසට ඉල්ලමින් යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් හෝ ඒ හා සබැඳි යම් පුද්ගලයකු විසින් කරනු ලබන ඕනෑම ක්‍රියාවක්

(f) කාඩ්පත්හිමියා විසින් බැංකුවේ කාර්ය භාර නිළධාරියකුට හැර වෙනත් පුද්ගලයකුට කාඩ්පත් ලබා දීම.

(g) බැංකුව විසින් කාඩ්පත අවලංගු වනවා යැයි මුහුණතේ සඳහන් වන දිනට පෙර කාඩ්පත පවරා දෙන ලෙසට විධාන කිරීමේ අයිතිය බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම, එකී විධාන කිරීම හෝ පවරා දීම බැංකුව විසින් සෘජුවම කිරීම හෝ කරනු ලැබීම හෝ සේවා සැපයුම් ආයතනයක් හෝ බැංකුවේ නියෝජිතයකු මඟින් කිරීම.

(h) බැංකුව විසින් කාඩ්පත් හෝ කාඩ්පත් ගිණුම් අවසන් කිරීමට වන සිය බලය ක්‍රියාත්මක කිරීම.

(i) කාඩ්පත නැවත අත්පත් කර ගැනීම සහ/හෝ කාඩ්පත නැවත එවීම හෝ කාඩ්පතට ගරු කිරීමට සේවා ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා අයදුම්කරුගේ හෝ කාඩ්පත්හිමියාගේ මූල්‍ය තත්ත්වයට හෝ කීර්තියට සිදුවන්නේ යැයි කියන හානිය.

(j) 26 වන වගන්තිය යටතේ බැංකුවට කරන ලද දුෂ්ප්‍රකාශයක්, අවනිදේශනයක්, දෝෂයක් හෝ අත්හැරීමක් වැනි කරුණු සැඟවීමක්.

(k) ගාස්තු ගෙවීම කිසියම් කාරණයක් නිසා පැහැර හැරීම.

(l) හිඟ මුදල් ගෙවීමට බැංකුව හෝ බැංකුවේ බලය ලත් නියෝජිතයකු විසින් විධාන කිරීම/ හිමිකම් පෑම අපහාසයක් හෝ කාඩ්පත්හිමියාගේ චරිතය පිළිබඳ පිළිබිඹුවක් කිසිදු ආකාරයකට සිදු නොවේ.

තෙවන පාර්ශවය සේවා සැපයුම්කරු වෙත සහ/හෝ එවැනි තෙවැනි පාර්ශවය සේවා සැපයුම්කරුවකුගේ කොන්ත්‍රාත්කරුවකු විසින් විවිධ සේවාවන් සඳහා කරන සංනිවේදනය කිරීම සහ පිළියෙළ කිරීම් වලට එවැනි තෙවැනි පාර්ශවීය සේවා සැපයුම්කරුකු හෝ බැංකුව විසින් ගෙවනු ඇත. කාඩ්පත්හිමියා විසින් එවැනි සියළු ගෙවීම් සඳහා වගකිව යුතු වේ. උපරිම පරිශ්‍රමයක් යන පදනම යටතේ සහයෝගය ලබා දෙන අතර, කාලය පිළිඳව ප්‍රශ්න දුර ප්‍රමාණය සහ ස්ථානය අනුව එකී සහයෝගය නොලැබී යනු ඇත. තෙවන පාර්ශවයේ සේවා සැපයුම්කරුවකු විසින් යෝජනා කරනු ලබන සහ/හෝ පත් කරනු ලබන රක්ෂණ වෛද්‍ය සහ/හෝ නීතිවෘත්තිකයන් ඔවුනගේ සේවා නියුක්තිකයක් නොවන අතර, සේවා සැපයුම්කාර තෙවන පාර්ශවීය කොන්ත්‍රාත්කරුවන්ගේ සේවකයකු නොවේ. ඒ අනුව ඔවුන් රක්ෂණ, වෛද්‍ය, නීති සේවාවන් මඟින් උද්ගත වන වැඩෙහි යෙදෙන බවට, ප්‍රයෝජන ගන්නා බවට, ක්‍රියාකිරීමට නොසළකාහැරීමට වගකීමක් නොමැත. බැංකුව සේවා සැළසුම්කිරීම හෝ භාවිතා කිරීම සේවා සම්බන්ධයෙන් කිසිඳු ආකාරයක වගකිව යුතු හෝ වගකීම භාර ගත යුතු නොවේ.

26. <u>තොරතුරු හෙළි කිරීම.</u>

පොදු නීතිය යටතේ මේ අවශ්‍ය ප්‍රමාණයට, මෙහි මින්මතුවට දක්වා ඇති 26 වන වගන්තියට යටත්ව බැංකුව කාඩ්පත්හිමියා සහ බැංකු අතර පවතින සියළුම කටයුතු සහ ගණුදෙනු පිළිබඳව වන සියළුම තොරතුරුවල රහස්‍යභාවය සුරකී. එතෙකුදු වුවත් මතු දැක්වෙන දෑ සම්බන්ධයෙන් තොරතුරු ලබාදීමට කාඩ්පත්හිමියා බැංකුවට බලය ලබාදේ.

(a) මුදල් ගෙවීම් පැහැර හරිනා සේවාදායකයින් සම්බන්ධයෙන් ණය ආයතනයක් හෝ දත්ත ගබඩාවක් පවත්වාගෙන යන කිසියම් බැංකුවකට, මූල්‍ය ආයතනයකට හෝ ණය ආයතනයකට.

(b) මෙම ගිවිසුම් කාඩ්පත් ගිණුම යටතේ කිසියම් අයිතියක් වෙනුවෙන් සත්‍ය හෝ යෝජිත පැවරුම්ලාභීන් වෙත.

(c) බැංකු වෙත විශ්වාසනීය ලෙස ක්‍රියා කිරීමේ යුතුකම ඇති යම් නියෝජිතයකු, කොන්ත්‍රාත්කරුවකු හෝ සේවා සැපයුම්කරුවකුට හෝ අදාළ සමාගමක් .

(d) කිසියම් අධීක්ෂණ හෝ පාලන අධිකාරියක් ,

(e) ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ යමක් කිරීමට නියම කරනු ලැබූවකුට ,

(f) බැංකුව සමඟ වාණිජ්‍ය පරමාර්ථයෙන් සම්බන්ධ වී ඇති කිසියම් කාර්යාලයක් හෝ සමාගමක ශාඛාවක්,

(g) මාස්ටර් කාඩ් සමාගම හෝ එහි අනුබද්ධ සමාගම්

27. <u>නැති වූ කාඩ්පත් සම්බන්ධ වගකීම්</u>

කාඩ්පතක් නැතිවුවහොත් හෝ සොරකම්කරනු ලැබුවහොත් කාඩ්පත්හිමියා විසින් ශ්‍රී ලංකාවේ කාඩ්පත් මධ්‍යස්ථානයකට වහාම දැනුම් දිය යුතුය. කාඩ්පත්හිමියා විසින් නැතිවීම/සොරකම සිදු වූ ප්‍රදේශයේ පොලීසිය හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකට වාර්තාවක් ගොනුකළ යුතුය. ශ්‍රී ලංකාවේ කාඩ්පත් මධ්‍යස්ථානයට නැති වූ බව දැනුම්දෙන තුරු කාඩ්පත මත රඳන්නා වූ වියදම්වල වගකීම කාඩ්පත්හිමියා සතු වේ.

කාඩ්පත්හිමියාට කාඩ්පත නැතිවීම සම්බන්ධයෙන් දුරකථනයෙන් වාර්තා කළ හැකි අතර, ඉන් පසුව කාඩ්පත් නැති වූ බව තහවුරු කරමින් හෝ වියදම් අත්හැර දමමින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක් කාඩ්පත් මධ්‍යස්ථානයට යැවීමෙන් හෝ නැතිවීම සිදුවූ ප්‍රදේශයේ හෝ පොලිස් ස්ථානයේ හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ

නියෝජිත ආයතනයක ගොනු කරන ලද වාර්තාවේ සහතික කරන ලද පිටපතක් බැංකුව වෙත ලබා දීම කළ හැක.

28. <u>ගෙවීම.</u>

28.1 ප්‍රකාශනය ලැබීමෙන් අනතුරුව කාඩ්පත්හිමියා විසින් ප්‍රකාශනයේ විස්තර කර ඇති ''ගෙවිය යුතු අවම සම්පූර්ණ මුදල'' හෝ බැංකුවට ගෙවිය යුතු ය. සෑම අතිරේක කාඩ්පත්හිමියකුම ප්‍රකාශනය ලැබීමෙන් අනතුරුව ප්‍රාථමික සාමාජිකයා සමඟ ගෙවිය යුතු අවම සම්පූර්ණ මුදල බැංකුවට එක්ව සහ වෙන් වෙන්ව ගෙවීමට වගකීමෙන් බැඳේ.

28.2 මෙම ගිවිසුමෙහි වන නියමයන් හෝ කොන්දේසි වලින් කිසිවක් හෝ නීතියෙහිලා හෝ බැංකුව සහ කාඩ්පත්හිමියා අතර කලින් කලට ඇති වන්නා වූ වෙනත් ගිවිසුමක් නිසා පවත්නා බැංකුවේ හිලව් කිරීමට, පැවරීමට සහ මුදල් උපයෝගීකර ගැනීමට වන අයිතියට බලනොපැවැත් වේ. බැංකුවට ලියමනක් වශයෙන් තබාගෙන ඇති තැන්පතුවකට විරුද්ධව විවෘත කර ඇති විටෙක තැන්පතුවෙහි ආදායම් කාඩ්පත්හිමියාගේ ගිණුමේ හිඟ හිටවා ඇති මුදලට එරෙහිව ගලපනු ඇත.

28.3 කාඩ්පත්හිමියාගේ වගකීම සම්බන්ධයෙන් බැංකුවට වන ගෙවීම් අදාළ නිෂ්කාෂණය වූ මුදල් බැංකුවට ලැබෙන තෙක් බැංකුව වෙත සිදුනොකරන ලද බවට සලකනු ඇත.

28.4 මෙම නියමයන් සහ කොන්දේසි යටතේ බැංකුවට අයවිය යුතු සියළු මුදල් කිසිඳු ආකාරයක හිලව් කිරීමක් හෝ ප්‍රතිවිරුද්ධ ඉල්ලීමක් හෝ අතින් අතට බැංකුව විසින් වෙනත් පුද්ගලයකුගේ ලැබිය යුතු යැයි කියන හෝ හිඟ හිටවා ඇතැයි කියන මුදලක් කිසිඳු ආකාරයකින් කපාහැරීමෙන් තොරව ගෙවිය හැකිය. කාඩ්පත්හිමියාගේ කිසියම් නෛතික සීමාවන් නුසුදුසුකමක් හෝ නොහැකියාවක් තිබුණේ වුව ද බැංකුවට කාඩ්පත්හිමියාට අයත් බැංකුවේ සන්තකයේ, පාලනයේ හෝ බලයේ තිබෙන සියලු වත්කම්, මුදල්, තැන්පතු, සුරැකුම්පත් පොදු ලියමනක් යටතේ තබා ගත හැක.

28.5 භාණ්ඩ සහ/හෝ සේවා සැපයීම සම්බන්ධයෙන් දෙන ලද යම් ණයමුදලක් බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත බැංකුවට පිළිගත හැකි ආකාරයෙන් සහ මාස්ටර් කාඩ්හි දැනට පවත්නා අදාළ වන නියමයන් සහ කොන්දේසීන්ට අනුකූලව දැනුම්දීමක් ලද පසුව පමණක් බැංකුව විසින් කාඩ්පත් ගිණුමට අදාළ කර ගනු ඇත.

28.6 ගෙවීමක් නියෝජනය කරනු ලබන චෙක්පතක්, ගෙවීමට ඉදිරිපත් කරන ලද බැංකුව විසින් කිසියම් හේතුවක් මත අගරු කරන ලද විටෙක, කාඩ්පත්හිමියා අදාල නීතිය යටතේ අපරාධ නීතිකෘත්‍යයන් වලට වගකීමෙන් බැඳෙනු ඇත.

28.7 කාඩ්පත් ගිණුමෙහි හිඟ හිටවා ඇති සම්පූර්ණ මුදල කාඩ්පත්හිමියා විසින් හෝ ඔහු මිය ගිය, වස්තු භංගත්වයට පත්වූ හෝ කාඩ්පත්හිමියාගේ ව්‍යාපාර ගණන් බේරා වසාදමන විටක ඔහුගේ අනුප්‍රාප්තිකයන් හෝ පැවරුම්ලාභීන් විසින් ගෙවිය යුතුය. නැවත ගෙවීමේ වගකීම කාඩ්පත්හිමියාගේ සේවා යෝජකයා විසින් දරනු ලබන අවස්ථාවක සහ එවැනි සේවායෝජකයකුගේ ව්‍යාපාරය ගණන් බේරා වසාදමන ලද හෝ බුන්වත්භාවයට පත්ව ඇති විටක හෝ කිසියම් හේතුවක් මත වස්තුභංගත්වයට පත්ව ඇතැයි ප්‍රකාශ කර ඇති විටෙක සහ/හෝ එවැනි ගෙවීමක් කළ නොහැකි විටෙක බැංකුව සම්පූර්ණයෙන් සෑහීමට පත්වන පරිදි සියළු මුදල් පෞද්ගලිකව ගෙවීමට කාඩ්පත්හිමියා වගකීමෙන් බැඳේ.

28.8 ප්‍රකාශනය නොලැබීම කාඩ්පත්හිමියා විසින් ගෙවීම් නිසි කලට නොගෙවීමට ප්‍රමාණවත් හේතුවක් වශයෙන් අර්ථ විග්‍රහ කළයුතු නොවේ. කිසියම් හේතුවක් මත ප්‍රකාශනය නොලද විටක ඔහුගේ/ ඇයගේ අවසාන ශේෂය සහ/හෝ ප්‍රකාශනයෙහි දෙවන පිටපත බැංකුව වෙත ඇමතුමක් ලබාදී ඉල්ලා සිටීමටත් අදාල වන සියළු ගාස්තු බැංකුවට ගෙවීමටත් කාඩ්පත්හිමියා ප්‍රතිඥා දෙයි.

28.9 චෙක් තැන්පතු අයකිරීමේ ක්‍රමයක් වශයෙන් පිළිගනු ලබන අතර, චෙක්පත උපලබ්ධිවී ගෙවීම් කරන බැංකුව විසින් මුදල් ගෙවන තුරු බැංකුවට මුදල් ලැබී නොමැති බව සැලකේ, ඕනෑම මුදල් තැන්පතුවක් කාඩ්පත් ගිණුමට බැර වූ විටෙක පමණක් එය බැංකුව වෙත ලැබුණා සේ සලකනු ඇත.

28.10 කාඩ්පත්හිමියා විසින් ගෙවීම් සිදුකල යුතු දිනට කාඩ්පත්හිමියා කාඩ්පත් බිලෙහි හිඟ හිටවා ඇති මුදලින් ප්‍රතිශතයක් කාඩ්පත්හිමියාගේ ජංගම හෝ ඉතුරුම් ගිණුම හර කිරීම මඟින් ගෙවන ලෙසට බැංකුව වෙත ඉදිරිපත් කිරීමට කාඩ්පත්හිමියා එකඟ වේ.

28.11 එවැනි ඕනෑම ස්ථාවර උපදෙසකට වන සංශෝධනයක් හෝ අවලංගු කිරීමක් අවම වශයෙන් මීළඟට ගෙවීම් කළ යුතු දිනයට සති 02කට ප්‍රථමයෙන් බැංකුව වෙත ඉදිරිපත් කිරීමට කාඩ්පත්හිමියා එකඟ වේ.

28.12 ගිණුමක මුදල් නිරාකරණය කිරීම සඳහා බැංකුවට ලබා දෙන සෘජු ස්ථාවර හර උපදෙසකට පහත දැක්වෙන අමතර කොන්දේසීන් සහ නියමයන් ද අදාළ වේ.

අ. එවැනි ස්ථාවර උපදෙසකට එරෙහිව බැංකුව වෙත ඉදිරිපත් කරන චෙක්පතක් හෝ වෙනත් සැලසුමක් සම්බන්ධයෙන් පූර්වතාවය ලබාදීමේ අයිතිය බැංකුව විසින් රඳවා තබාගැනීමට කාඩ්පත්හිමියා එකඟ වේ.

ආ. ස්ථාවර උපදෙසකට අනඅනුකූල වීම සඳහා අදාළ නිරාකරණ ගිණුමට, ගෙවීමට නියමිත දිනට පෙර ප්‍රමාණවත් මුදල් ලබාදීමට කාඩ්පත්හිමියා එකඟ වේ. නිරාකරණ ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොමැති විටෙක බැංකුව සිය අභිමතය පරිදි එකී ස්ථාවර උපදේශයේ සඳහන් ගෙවිය යුතු මුදල ආවරණය කිරීම සඳහා කලින් කලට අයිරා ලබා දෙනු ඇත. විධාන කළ විටෙක

සියලු හිඟ හිටවා ඇති මුදල සමඟ ඒ මත වන මූල්‍යමය වෙනත් ගෙවීම් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාතයකට අනුව ගෙවීමට කාඩ්පත්හිමියා බැඳෙනු ඇත.

28.13 බැංකුව විසින් කිසියම් අවස්ථාවක දින රහිත චෙක්පත් සහ/හෝ බැංකුව නමින් මුදල් සහිත සුරැකුමක් තැන්පත් කරන මෙන් කාඩ්පත්හිමියාට ඉල්ලා සිටිය හැකි අතර, එය කාඩ්පත්හිමියා කාඩ්පත නිකුත් කරන ලෙසට ඉල්ලා නොමැති විටදී පවා අවශ්‍ය විය හැක. කාඩ්පත්හිමියා එවැනි අවස්ථාවක එකී චෙක්පත මත දිනයක් යෙදීමට සහ යොදා ඇති දිනට බැංකුවට ගෙවිය යුතු මුදලට එරෙහිව එකී චෙක්පතක් ඉදිරිපත් කිරීමට බලය ලබා දී ඇති බවට සැලකේ.

28.14 කාඩ්පත්හිමියා ගෙවිය යුතු විටෙක යම් මුදලක් ගෙවීමට අපොහොසත් වූවහොත් හෝ එම මුදල වෙනත් ආකාරයකින් ගෙවිය යුතු දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ප්‍රකාශයට පත් කරන ලද්දේ නම් හෝ කාඩ්පත්හිමියා විසින් යම් මූල්‍යමය ණය වෙනත් පහසුකමක් භුක්තිවිඳීම මත බැංකුව සමඟ වන ගිවිසුමක් යටතේ වන වෙනත් හිඟ මුදලක් ගෙවන්නේ නම් එවැනි විටක දී බැංකුව එක් එක් ගිවිසුමෙහි හෝ මෙම ගිවිසුමෙහි වන සිය අයිතීන් වලට අගති රහිතව මෙම ගිවිසුමෙහි දක්වා ඇති පරිදි බැංකුවේ පූර්ණ අභිමතය මත සිය පූර්ණ හෝ සියළු අයිතීන් ක්‍රියාත්මක කිරීමට හිමිකම් ලබනු ඇත.

28.15 කිසියම් කාඩ්පත් සමාජිකයකුගේ අයවිය යුතු මුදලක් සිය බලය ලත් අයකර ගැනීමේ නියෝජිත ආයතනයකට පැවරීමේ අයිතිය බැංකුව රඳවා තබා ගන්නා අතර එලෙස තිබීමේ දී කරන ලද වියදම් කාඩ්පත්හිමියාගේ ගිණුමින් අය කර ගැනීමට බැංකුවට හිමි කම් ලබා දේ.

28.16 කාඩ්පත්හිමියා හෝ ඔහු වෙන්වෙන් ඉදිරිපත් කරන ලද කරන ලද ගෙවුම් උපකරණයක් ගරු නොකරන අවස්ථාවක, කාඩ්පත්හිමියාට එරෙහිව නීතිමය වශයෙන් ක්‍රියාකිරීමටත්, සිය අභිමතය පරිදි දඩ මුදල් සහ/හෝ කාඩ්පත් ගිණුම අවලංගු කිරීමට බැංකුව අයිතිය රඳවා ගනී.

28.17 මෙම ගිවිසුමෙහි ඉහත දැක්වෙන ප්‍රතිපාදනයන්ට අගති රහිතව කාඩ්පත්හිමියා මසකට වඩා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීනම් කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් ගිණුම පියවීම සම්බන්ධයෙන් පැහැදිලි සහ විශේෂ උපදෙස් ලබා දිය යුතු අතර, ඔහුගේ/ඇයගේ පිටත්වීමට ප්‍රථම එවැනි උපදෙස් පිළිබඳව බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය අවවාද කළ යුතු ය.

## 29. සංශෝධනයන්

මෙම ගිවිසුමෙහි කිසියම් නියමයන් පූර්ව දැනුම් දීමකින් තොරව කලින් කලට වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට සහ/හෝ ආදේශ කිරීමට අයිතිය බැංකුව රඳවා තබාගනී. එවැනි ඕනෑම සංශෝධනයක් පහත දැක්වෙන 31 වන වගන්තිය යටතේ දැනුම්දීම මඟින් ක්‍රියාත්මක සහ බලාත්මක කළ බවට සැලකේ.

30. <u>අවවාද කිරීමේ ලුහුඬු ප්‍රකාශනයන්</u>

ශ්‍රී ලංකාවේ හෝ විදේශයකදී වන අවවාද කිරීමේ ලුහුඬු ප්‍රකාශයන්හිදී කාඩ්පත පිළිබඳව සඳහන් කරමින් සේවා සැපයුම් ආයතනයන්ට කාඩ්පත අත් කර ගැනීමේ දැනුම්දීමේ පරම අයිතිය සහ අභිමතය බැංකුව සතු වේ.

31. <u>දැන්වීම්</u>

බැංකුව කිසියම් දැන්වීමක් කාඩ්පත්හිමියාට සාමාන්‍ය සහ අවසාන වශයෙන් දැන ගන්නට යෙදුනු ලිපිනයට පූර්ව ගෙවුම් තැපැල් මාර්ගයෙන් යවනු ඇති අතර, එවැනි ලේඛන අදාල ලිපිනයක පිටපත් කර යැවීමෙන් අනතුරුව යථාපරිදි භාරදුන්නා සේ සලකනු ලැබේ.

කාඩ්පත් ගිණුම් ප්‍රකාශනයක සඳහන් කර ඇති හෝ ගිණුම් ප්‍රකාශනයෙහි කොටසක්වන්නා වූ යම් තොරතුරක් හෝ දැනුම්දීමක් ද මෙම ගිවිසුම යටතේ දැන්වීම් ලෙස සැලකේ.

කාඩ්පත්හිමියා විසින් යම් දැන්වීමක් බැංකුව වෙත එවන විට පූර්ව ගෙවුම් තැපැල් මඟින් පහත ලිපිනයට එවීම හෝ තහවුරු කිරීම කළ හැකිය.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, මාස්ටර් කාඩ් මධ්‍යස්ථානය, 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

32. <u>බලාත්ම කිරීමේ වියදම්</u>

ප්‍රාථමික කාඩ්පත්හිමියා හෝ ඕනෑම අතිරේක කාඩ්පත්හිමියකු මෙම නියමයන් හා කොන්දේසි බලාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීමට උත්සාහ කිරීමේ දී දරන්නට සිදුවූ සියලු වියදම්, සියලු නෛතික ගාස්තු සහ වියදම් ද ඇතුළු ව පූර්ණ හානි පූර්ණ පදනමක් යටතේ බැංකුවට එක්ව සහ වෙන් වෙන්ව හානි පූරණය කිරීමට වගකීමෙන් බැඳේ.

33. <u>අතිරේක කාඩ්පත්</u>

බැංකුව විසින් කලින් කලට තීරණය කර ගනු ලැබන නියමයන් හා කොන්දේසීන් මත බැංකුව විසින් කාඩ්පත්හිමියාගේ පවුලේ සාමාජිකයන්ට සිය පූර්ණ අභිමතය පරිදි අතිරේක කාඩ්පත් පහසුකම ලබාදෙනු ඇත. කාඩ්පත් ගිණුම යටතේ අතිරේක කාඩ්පත් දරන්නකු/දරන්නන් සහ එය නිකුත් කරන ලෙසට බලය ලබා දෙන කාඩ්පත්හිමියා කාඩ්පත් භාවිතයෙන් කරන ලද වියදම් සියල්ලට එක්ව සහ වෙන් වෙන්ව වගකීමට බැඳේ. අතිරේක කාඩ්පත් පහසුකම ප්‍රාථමික කාඩ්පත්හිමියාගේ ඉදිරි පැවැත්ම අනුව තීරණය වේ.

34. <u>ගෙවීම් ප්‍රයෝජනයට ගැනීම.</u>

කාඩ්පත්හිමියා සහ ඔහු වෙනුවෙන් බැංකුවට ලැබෙන සියලු ගෙවීම්, කාඩ්පත්හිමියා හෝ ගෙවීම් සිදුකරන වෙනත් පුද්ගලයකු විසින් පරිහරණය සඳහා ලබාදුන් යම් විශේෂිත උපදේශයක තිබුණේ වුවද, බැංකුව විසින් යෝග්‍ය යැයි සිතන ආකාරයට සහ ක්‍රමයට ප්‍රයෝජනයට හෝ පරිහරණයට ගනු ඇත.

35. <u>දුරකථන, අන්තර්ජාල, ටෙලක්ස්, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් උපදෙස් සඳහා අවසර සහ හානි පූරණය.</u>

35.1 කාඩ්පත්හිමියා හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථන, අන්තර්ජාල, ටෙලක්ස්, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් මඟින් කලින් කලට ලබා දෙනු ලබන හෝ ලබාදීමට අදහස් කරනු ලබන යම්කිසි දැනුම් දීමක්, උපදෙසක්, විධානයක් හෝ වෙනත් පණිවිඩ හුවමාරුවක දී, බැංකුව වෙතින් කිසිඳු විමසීමක් නොකර සහ උපදෙස් ලබාදෙන හෝ ලබාදීම අපේක්ෂා කරන තැනැත්තාගේ අධිකාරී බලය හෝ අනන්‍යතාවය සහ උපදෙස් ලද අවස්ථාවේ බලපැවැත්වුණු අවස්ථානුගත කරුණු සලකා බැලීමකින් තොරව යන කරුණු වලට අගති රහිතව විශ්වාස තැබීමටත් එයට අනුකූලව ක්‍රියා කිරීමටත් කාඩ්පත්හිමියා බැංකුවට බලය ලබාදේ. කාඩ්පත්හිමියා බැංකුව විසින් ලබාදෙන තීරණය උපදෙස් ලද දිනට අවසානාත්මක බව පිළිගනු ඇත.

35.2 උපදෙස් කාඩ්පත්හිමියන්ගේ පූර්ණ බලයට පිටවන බවටත් ඒවායින් බැඳී සිටින බවට සැලකීමටත් බැංකුවට හිමිකම් ඇති අතර, ලබාදෙනු ලබන උපදෙස් මුදල් ගෙවීමට හෝ බැහැර කිරීමට හෝ යම් මුදලක් ලේඛනයක් පවරා දීමට අදාල වන හෝ කාඩ්පත්හිමියාට කිසියම් ගිවිසුමකට බැඳ තැබීමට හෝ බැංකුව සමඟ වෙනත් ගිවිසුමකට හෝ වෙනත් පුද්ගලයකු සමඟ ඇති ගිවිසුමකට කාඩ්පත්හිමියා කවර ආකාරයේ හෝ වෙනත් ගිවිසුමක හෝ එකඟවීමට අදාළ ගණුදෙනුවේ හෝ එකඟතාවයේ ස්වභාවය හෝ සම්බන්ධිත මුදල පිළිබඳව සැලකීමෙන් තොරව උපදෙස්හි වන යම් දෝෂයක් සංදිග්ධතාවයක් හෝ වරදවා වටහා ගැනීමක් හෝ අපැහැදිලිතාවයක් නොතකා බැංකුව විසින් යෝග්‍ය යැයි සලකනු ලබන පියවරට ගැනීමටත් ඒ කෙරෙහි විශ්වාසය තැබීමටත් බැංකුවට හිමිකම් ඇත.

35.3 මෙම බලය පැවරීමේ සහ හානිපූරණය කිරීමේ නියමයන්ට අනුකූලව බැංකු ක්‍රියාකරන විටදී, හෝ එම උපදෙස් සම්බන්ධයෙන් කුමන ආකාරයකින් බැංකුවට දැරීමට සිදුවන සහ උද්ගතවන සියලු පාඩු, හිමිකම්, නීති කෘත්‍යයන්, කාර්යාවලීන්, විධානයන්, අලාභ, නඩු, ගාස්තු සහ වියදම් වලට එරෙහිව බැංකුවට හානි පූරණය කිරීමට සහ කරනු ලැබීමට කාඩ්පත්හිමියා අවලංගු කළ නොහැකි සේ භාර ගනී.

35.4 බලය ලබා දීමට සහ හානි පූරණය කිරීමේ මෙම නියමයන් බැංකුව වෙත කාඩ්පත්හිමියාගේ අවසන් කිරීමේ දැන්වීම ලැබෙන තෙක් සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සාධාරණ කාලයක් දක්වා ක්‍රියාවෙහි සහ බල පැවැත්වෙනු ඇත. එවැනි කාලය අවසන් වීමට පෙර මෙම නියමයන්ට සහ බලය පැවරීම මත කරන ලද යම් ක්‍රියාවක් කෙරෙහි වගකීමෙන් කාඩ්පත්හිමියා මුක්ත නොවේ.

36. <u>විවිධ</u>

36.1 කාඩ්පත්හිමියා සම්බන්ධයෙන් අවශ්‍යවන යම් වැඩිදුර තොරතුරු ලබාගැනීමට සිය සේවා යෝජකයාගේ හෝ වෙනත් මූලාශ්‍රයක් සම්බන්ධ කර ගැනීමට කාඩ්පත්හිමියා බැංකුවට මෙමඟින් බලය ලබාදෙයි.

බිල්පතක් මත ගෙවිය යුතු මුදල ගැන දුරකථන මාර්ගයෙන් කාඩ්පත් හිමියාට සිහිකැඳවීමක් ලබාදීමට හෝ කාඩ්පත්හිමියා වෙනුවෙන් දුරකථන ඇමතුමක් ලබාගන්නා පුද්ගලයා වෙත සිහිකැඳවීමේ පණිවිඩයක් තැබීමට බැංකුවට හිමිකමක් ඇතිබව කාඩ්පත්හිමියා එකඟ වේ. කාඩ්පත්හිමියාට ලිඛිතව හෝ වෙනත් ආකාරයෙන් කාඩ්පත මත ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් සිහි කැඳවීමෙන් කුමන ආකාරයෙන් හෝ වගකීමක් බැංකුවට නොමැති අතර, බැංකුව විසින් ඉහත දැක් වූ ආකාරයේ සිය මනාපය හෝ අයිතිය ක්‍රියාත්මක කිරීම ප්‍රශ්ණ කල නොහැක.

36.2 කාඩ්පත්හිමියා මෙමගින් බැංකුවට කාඩ්පත් මත ගෙවිය යුතු කිසියම් හිඟ මුදලකට එරෙහිව සිය වත්කම් හෝ මුදල් තහනමට ගැනීමට සිය සමාගමට හෝ බැංකුවට ප්‍රවේශවීමටත් මේ සම්බන්ධයෙන් බැංකුවට යෝග්‍ය යැයි සලකනු ලබන සියලු ක්‍රියාවන් කාර්යයන් සහ දේවල් කිරීමටත් අවලංගු කළ නොහැකි ආකාරයෙන් බලය ලබා දේ. මෙම 36.2 වගන්තිය මෙම ගිවිසුම අවසන් වන තෙක් පවතී.

36.3 බැංකුවේ කිසිඳු අයිතිවාසිකමක් බැංකුවේ ක්‍රියාවක් හෝ හැසිරීමක් මත හෝ එවැනි අයිතින් ක්‍රියාත්මක කිරීමෙහිලා වන කිසියම් ප්‍රමාද දෝෂයක් හෝ ප්‍රමාදයන් මඟින් අතහැර දැම්මා සේ සැළකිය නොහැකි අතර, බැංකුව විසින් ලිඛිතව විශේෂයෙන් අතහැර දමන තෙක් සම්පූර්ණ බලපැවැත්වෙන හා ක්‍රියාවේ යොදනු ඇත.

36.4 බැංකුවේ වරණය මත කිසියම් තෙවන පාර්ශවයකට කාඩ්පත්හිමියාගේ හිඟ හිටවා ඇති සහ අයවිය යුතුව ඇති යමක් හෝ සියල්ල විකිණීමට, පැවරීමට හෝ භාරදීමට බැංකුවට පූර්ණ හිමිකමක් සහ පූර්ණ බලයක් ඇතිබව කාඩ්පත්හිමියා ප්‍රකාශිත පිළිගන්නා අතර, ඒ සම්බන්ධයෙන් බැංකුව විසින් කාඩ්පත්හිමියාට ලිඛිතව දැනුම්දීම මඟින් එවැනි තෙවැනි පාර්ශවීය කාඩ්පත්හිමියකු බැංකුවට වන එවැනි වගකීම පිළිගැනීමට කාඩ්පත්හිමියා බැඳී සිටී. මේ වෙනුවෙන් වන ගාස්තුවක් කාඩ්පත්හිමියාගේ ගිණුමෙන් අය කර ගනු ඇත.

36.5 කාඩ්පත්හිමියාගේ ගිණුමෙහි යම් බැර ශේෂයක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පොලිය ගෙවීමේ කිසිඳු වගකීමක් බැංකුව වෙතින් කිසිඳු ආකාරයේ ඇති නොවන බවට වන කාරණය කාඩ්පත්හිමියා හඳුනා ගනී.

36.6 කාඩ්පත්හිමියාට ඔහුගේ/ඇයගේ කාඩ්පත් සාමාජිකත්වය මතම අනුග්‍රාහක වැඩසටහන් වලට අදාල වන නියමයන් හා කොන්දේසීන් මඟින් පාලනය වනු ඇත.

36.7 සේවා සැපයුම් ආයතනය විසින් ඔවුනගේ වෙළඳ බඩු සේවාවන් සම්බන්ධයෙන් වට්ටම් ලබා දීමට හෝ මිල අඩු කිරීමක් සංවිධාන කරන හෝ පවත්වන විට දී කාඩ්පතට ගරු නොකරනු ඇත.

මෙම ගිවිසුම ඕනෑම අවස්ථාවක දී වෙනස් කිරීමට බැංකුවට අයිති ඇති අතර, එවැනි යම් වෙනසක් පිළිබඳව කාඩ්පත්හිමියාට දැනුම් දෙනු ඇත. කාඩ්පත්හිමියා විසින් වෙනස් කිරීම් පිළිබඳව දැනුම්දීම ලැබීමෙන් පසුව කාඩ්පත් තව දුරටත් තබා ගන්නේ නම් හෝ භාවිතාකරන්නේ නම් කාඩ්පත්හිමියා විසින් වෙනස් කිරීම් පිළිගනු ලැබූ බවට බැංකුව සලකනු ලැබේ. කාඩ්පත්හිමියා විසින් වෙනස්කම් පිළිනොගතහොත්, කාඩ්පත්හිමියා විසින් කාඩ්පතෙහි චුම්භක තීරුව කැපී යන ආකාරය කොටස් 04කට විකර්ණව කැපීමෙන් සහ කොටස් බැංකුවට භාරදීමෙන් කාඩ්පත්හිමියාට මෙම ගිවිසුම අවසන් කළ හැකිය. එවැනි අවසන් කිරීමට පෙර කරන ලද සියලු ගාස්තු සහ වියදම්වලට කාඩ්පත්හිමියා තවදුරටත් වගකීමට සහ බැඳෙන සහ වගකිව යුතු වේ.

37. <u>නීතිය සහ අධිකරණ පාත්‍රතාවය</u>

මෙම ගිවිසුම ලංකාවේ නීතීන්ට අනුකූලව බල පැවැත්වෙන සහ අර්ථවිග්‍රහ කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත ඒකකයන් විසින් නිකුත් කරනු ලබන නීතියක්, රෙගුලාසියක් හෝ උපදේසයක් මඟින් සංශෝධනයක් අවශ්‍ය කරන විටක දී මෙම ගිවිසුම ද ස්වයංක්‍රීයව සංශෝධනයව පවතිනු ඇත. කාඩ්පත් සහ කාඩ්පත් ගිණුම වලංගු සහ නීත්‍යානුකූල අරමුණ සඳහා පමණක් භාවිතා කරනු ඇත. කාඩ්පත් හෝ කාඩ්පත් ගිණුම කාඩ්පත්හිමියා විසින් භාවිතා කරන්නේ නම් හෝ වෙනත් අයකුට භාවිතා කිරීමට ඉඩ ලබාදෙන්නේ නම් එවැනි භාවිතා කිරීමක් සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයා වගකිව යුතු අතර, එවැනි භාවිතයක ප්‍රතිඵලයක් වශයෙන් අලාභ සහ/හෝ පාඩු බැංකුවට හෝ මාස්ටර් කාඩ් වෙත දරන්නට සිදු වූ සියලු අලාභ/ වියදම් ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය වේ.

38. <u>පවරා දීමේ නියමයන්</u>

බැංකුව විසින් ඕනෑම මාස්ටර් කාඩ් සමාගමකට හෝ එහි ඕනෑම අනුබද්ධිත සමාගමකට හෝ නිලය ලබන්නෙකුට (ඕනෑම මාස්ටර් කාඩ් ඒකකයකට මෙම ගිවිසුම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් දැනට හා අනාගතයේ ඕනෑම අවස්ථාවක දී පවරා දීමට කාඩ්පත්හිමියා මෙමඟින් කැමැත්ත ලබා දෙන අතර, එවැනි පවරාදීමක් බැංකුව විසින් හෝ ඕනෑම මාස්ටර් කාඩ්පත්හිමියා වෙත ලබා දෙන පවරා දීමේ නොතීසියේ සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක වනු ඇත.